**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - 2019**

**------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------**

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 8 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, **ආයතනයේ** 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

----------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු.7,562,138 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. එසේ වුවත් මෙම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කිරීම හා ප්‍රත්‍යාගණනය කිරීම සඳහා කළමනාකාර මණ්ඩලයේ උපදෙස් හා නිර්දේශ මත ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අස්පෘශ්‍ය වත්කම් ගිණුම් තැබීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධන ප්‍රදාන මඟින් රු.395,000 කට මිලට ගෙන තිබුණු ගිණුම්කරණ මෘදුකාංගයේ වටිනාකම අස්පෘශ්‍ය වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ කාර්යාල උපකරණ ලෙස දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී අස්පෘශ්‍ය වත්කම් යටතේ වර්ගීකරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුනාගෙන වත්කම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ස්ථාවර වත්කම් | 27,691,432 | 23,869,763 | 3,821,669 | පවත්නා වෙනස නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ගිණුම් හා උපලේඛන නිවැරදිව පවත්වා ගත යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආපසු ගෙවිය යුතු තැන්පත් යටතේ 2017 සහ 2018 වර්ෂ වලට අයත් රු.1,834,310ක් වූ පුස්තකාල තැන්පත් විගණන දිනය වූ 2020 ජූලි 20 දක්වාම ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පතු ගිණුමෙහි ඉතිරිව පවතින මුදල් වලින් වැඩි ප්‍රමාණයත් විදේශීය සිසුන්ගේ වන බැවින් ඔවුන් මෙරටට නැවත පැමිණීමේදී ආපසු ගෙවීමට කටයුතු කරනු ලැබේ. | පුස්තකාල තැන්පතු නිදහස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2019 දෙසැම්බර් 31 දිනැති භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව හඳුනාගෙන තිබුණු අබලි භාණ්ඩ සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ මත කටයුතු කිරීමට විධිවිධාන යොදා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2017 මැයි 04 දිනැති අංක 02/2017 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය | වාර්ෂිකව පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද 2015 වර්ෂයෙන් පසු පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණ සිදුකර නොතිබුණි . | මේ සඳහා කමිටුවක් පත්කර සමීක්ෂණයක් සිදු කර ඇති අතර අවසන් වාර්තාව කළමනාකාර මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය. | චක්‍රලේඛ ප්‍රකාරව පුස්තකාල පොත් සමීක්ෂණය කළ යුතුය. |
| (ඇ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 04 ඡේදයේ iii වගන්තිය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය සිදු කරන ලද පර්යේෂණයන් නිමකොට අවසන් වාර්තා පර්යේෂණ කමිටුවට ඉදිරිපත් කර එහි අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අවසන් වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීමකින් තොරව අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ 07 දෙනෙකුට සමාලෝචිත වර්ෂය සඳහා රු.2,733,670 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණි. | ඇතැම් සාමාජිකයන් පර්යේෂණ කාලය දීර්ඝ කර ඇති අතර ඇතැම් පිරිස් සිය පර්යේෂණ අවසන් කළ බව පමණක් දැනුම්දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලය තුළ දී පර්යේෂණ නිමකර අවසන් වාර්තා ඉදිරිපත් කළ යුතුය. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,778,095 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,852,049 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,078,954 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුද්ගලික පඩිනඩි වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාලි ශාස්ත්‍රපති සිංහල පාඨමාලාව සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය 2015 වර්ෂයේ සිට අඩු වී යන ප්‍රවණතාවයක් ද පාලි ශාස්ත්‍රපති ඉංග්‍රීසි හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා ඉංග්‍රීසි (සිංගප්පූරු) යන පාඨමාලා 02හි 2018 සහ 2019 වර්ෂයන්වල ශිෂ්‍ය ලියාපදිංචිය ශූන්‍ය අගයන් වී තිබුණ ද මෙම පාඨමාලා සඳහා ශිෂ්‍ය ආකර්ෂණය වැඩිකර ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | පාඨමාලා ආරම්භ කර පවත්වාගෙන යෑමට තරම් ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොසිටීම සහ ඒ සඳහා කටයුතු කළ ආචාර්යවරුන් වෙනත් සේවා වෙත යොමු වී ඇති තත්ත්වයක් නිරීක්ෂණය වන අතර මෙහි ප්‍රගතියක් ඇති කර ගැනීමට උත්සහ කරනු ලැබේ. | ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කර ගැනීමට ආයතනය කටයුතු කළ යුතුය. |
| (ආ) | 2005 ජනවාරි 05 දින සිට 2019 නොවැම්බර් 30 දින දක්වා වූ වසර 14කට ආසන්න කාලය තුළ ආයතනය විසින් නිකුත්කළ පුස්තකාල පොත් 139 ක් 2020 ජනවාරි 30 දින වනවිටත් ආපසු භාරදී නොතිබුණි .මෙම පොත් ආපසු භාර ගැනීමට හෝ වටිනාකම අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | භාර නොදෙන පොත් සඳහා අදාල දඩ මුදල් ආපසු ගෙවන පුස්තකාල තැන්පතු මුදලින් පාඨමාලා අවසානයේදී අයකර ගනු ලැබේ . | නිකුත් කළ පුස්තකාල පොත් ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කැලණිය මානෙල්ගම පරිශ්‍රයේ ඉදිකෙරෙන ආයතනයේ නව ගොඩනැගිල්ලේ මංගල ශිලා ස්ථාපනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී විවිධ වියදම් සඳහා රු.3,598,493 ක වියදමක් දරා තිබුණු අතර අවම පිරිවැයක් යටතේ උත්සව කටයුතු සංවිධානය කිරීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. එමෙන්ම ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු 2019 මැයි 14 වන දින පෞද්ගලික ආයතනයක් විසින් ආරම්භ කර ඇති නමුත් ගොඩනැගිල්ලේ සැලසුම විගණිත දිනය වූ 2020 අගෝස්තු 14 දිනය දක්වාම අනුමත කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මංගල ශිලා ස්ථාපනය සඳහා රු.3,598,493 ක වියදමක් දරා ඇත. | පිරිවැය අවම වන පරිදි කටයුතු කිරීමට කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |

**3.2** අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අත්‍යවශ්‍ය ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා ඉකුත් වර්ෂයේ ලැබී තිබුණු ප්‍රදාන වලින් රු. 1,585,350 ක් හා සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු රු. 860,000 ක් අදාල අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. | ඉදිරියේදී නිමකිරීමට බලාපොරොත්තු වන නව ගොඩනැගිල්ලට පිවිසීමේදි අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ අරමුණින් මෙම අරමුදල් වෙන් කර තබා ඇත . | රජයෙන් ලැබෙන ප්‍රදාන එම කාර්යයන් සඳහා ප්‍රශස්ත අයුරින් උපයෝජනය කර ගත යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අයවැයගත ආදායම් වියදම් සමඟ තත්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේ දී සියයට 25 සිට සියයට 100 දක්වා වූ විචලනයන් 09 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂ වලදී අයවැය මනා කළමනාකාරීත්වයකින් යුතුව පාලනය කිරීමට කටයුතු කරනු ලැබේ. | අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගත යුතුය. |